12 ශ්‍රේණිය

බෞද්ධ ශිෂ්ටාචාරය

නිපුණතාව; 2 බුදුරජාණන් වහන්සේගේ හා පරමාදර්ශී ශ්‍රාවක ශ්‍රාවිකාවන්ගේ විශිෂ්ට ලක්ෂණ.

නිපුණතා මට්ටම 2.2 :- බුද්ධ කාලීන පරමාදර්ශී ගිහි-පැවිදි, ශ්‍රාවක ශ්‍රාවිකා චරිත ඇගයීමට ලක් කරයි.

## ආනන්ද තෙරණුවෝ, සැරියුත් තෙරණුවෝ

(01) ආනන්ද කුමරුගේ පියතුමන් වූයේ,
1. සුද්ධෝදන ශාක්‍ය රජතුමාය.
2. අමිතෝධන ශාක්‍ය රජතුමාය.
3. දෝතෝධන ශාක්‍ය රජතුමාය.
4. මිතෝධන ශාක්‍ය රජතුමාය.
5. සුක්ක්‍රෝධන ශාක්‍ය රජතුමාය.

(02) ආනන්ද තේරුණ්ගේ ආචාර්යවරයා වූයේ,
1. අසිත තාපස තුමන්ය.
2. සර්ව මිත්‍ර බමුණු පඬි තුමන්‍ය.
3. පුණ්ණ මන්තානි පුත්ත තෙරණුවන්ය.
4. මහා කාශ්‍යප තෙරණුවන්ය.
5. සැරියුත් තෙරණුවන්ය.

(03) බුදුරදුන්ට වරින් වර උපස්ථාන කළ තෙරවරුන් පමණක් අයත් කාණ්ඩය වන්නේ,
1. නාගිත, උපවාන, රාධ, මේඝිය
2. නාගිත, සෝපාක, මේධංකර, වක්කලී
3. නාගිත, සුනීත, බෙල්ලට්ඨිය, නන්ද
4. නාගිත, උපාලි, භගු, මොග්ගල්ලාන
5. නාගිත, වක්කලී, මහානාම, උපාලි

(04) ‘‘ස්වාමීනි, අපි මේ නරගය අතහැර වෙනත් නගරයක් කරා යමුයැ’’ යි බුදුරදුන්ට ආනන්ද තෙරුණ් යෝජනා කළේ,
1. චිංචිමානවිකාවගේ දෝෂාරෝපණ නිසාවෙනි.
2. පටාචාරාවන්ගේ ක්‍රියා නිසාවෙනි.
3. මාර දූවරුන්ගේ ක්‍රියා කලාපය නිසාවෙනි.
4. මාගන්දියා බැමිනියගේ ක්‍රියා කලාපය නිසාවෙනි.
5. රජ්ජුමාලාගේ ක්‍රියා කලාපය නිසාවෙනි.

(05) බුදුරජාණන් වගන්සේ අසනීපව සිට සුවය ලබමින් සිටි මොහොතේ ‘‘ස්වාමීනි පළමුවෙන් සමාධිය වේද, නැතහොත් ඥානය වේ දැ’’ යි ගැඹුරු ප්‍රශ්ණයක් මතුකලේ,
1. නිග්‍රෝධ ශාක්‍ය රජු
2. කොසොල් රජු
3. බිම්බිසාර ලජු
4. අජාසත් රජු
5. මහානාම ශාක්‍ය රජු

(06) බුදුරජාණන් වහන්සේ පිරිනිවීම සඳහා කුසිනාරාවට වඩින අවස්ථාවේ දැඩි පිපාසයක් ඇතිවිය. මෙහිදී ආනන්ද හිමියන් පැන් රැගෙන ආවේ,

1. කුකුත්ථා නදියෙන්
2. සෝණ නදියෙන්
3. චම්පා නදියෙන්
4. යමුනා නදියෙන්
5. අචිරවතී නදියෙන්

(07) පළමුවන ධර්ම සංගායනාවේදී ආනන්ද තෙරුණ්ට පැවරුනේ,

1. විනය කටපාඩමෙන් පවත්වා ගැනීමටය.
2. දීඝ නිකාය කටපාඩමෙන් පවත්වා ගැනීමටය.
3. අංගුත්තර නිකාය කටපාඩමෙන් පවත්වා ගැනීමටය.
4. ඛුද්ධක නිකාය කටපාඩමෙන් පවත්වා ගැනීමටය.
5. සංයුත්ත නිකාය කටපාඩමෙන් පවත්වා ගැනීමටය.

(08) ආනන්ද තෙරණුවන්ගේ ආයු කාලය වන්නේ,

1. වසර අසූවකි.
2. වසර එකසිය හැටකි.
3. වසර අනූවකි.
4. වසර එකසිය දහයකි.
5. වසර එකසිය විස්සකි.

(09) ආනන්ද තෙරණුවන් සෝවාන් වූයේ,

1. මහාකාශ්‍යප තෙරුණ්ගෙන් ධර්මය ඇසීමෙනි.
2. බෙල්ලට්ඨිය තෙරුණ්ගෙන් ධර්මය ඇසීමෙනි.
3. පුණ්ණ මන්තානිපුත්ත තෙරුණ්ගෙන් ධර්මය ඇසීමෙනි.
4. සැරියුත් තෙරුණ්ගෙන් ධර්මය ඇසීමෙනි.
5. බුදුරදුන්ගෙන් තෙරුණ්ගෙන් ධර්මය ඇසීමෙනි.

(10) ආනන්ද තෙරණුවන්ට බුදුන් වහන්සේ අගතනතුරු කිහිපයක්ම ලබා දෙන ලදි. එම තනතුරු නිවැරදිව ඇතුළත් කාණ්ඩය වන්නේ,

1. බහුශ්‍රැතයන් අතර, සිහිකල්පනා ඇත්තවුන් අතර, අවබෝධ ශක්තිය ඇත්තවුන් අතර, ධෛර්‍ය සම්පන්න වූවන් අතර
2. බහුශ්‍රැතයන් අතර, සිහිකල්පනා ඇත්තවුන් අතර, අවබෝධ ශක්තිය ඇත්තවුන් අතර, ඍද්ධි බලය ඇත්තවුන් අතර
3. බහුශ්‍රැතයන් අතර, සිහිකල්පනා ඇත්තවුන් අතර, අවබෝධ ශක්තිය ඇත්තවුන් අතර, ප්‍රඥාවන්තයින් අතර
4. බහුශ්‍රැතයන් අතර, සිහිකල්පනා ඇත්තවුන් අතර, අවබෝධ ශක්තිය ඇත්තවුන් අතර, ධර්ම කථිකයින් අතර
5. බහුශ්‍රැතයන් අතර, සිහිකල්පනා ඇත්තවුන් අතර, අවබෝධ ශක්තිය ඇත්තවුන් අතර, විනයධාරීන් අතර

(11) සැරියුත් තෙරණුවන්ගේ මෑණියන් වූයේ,

1. මාගන්දියා බැමිණිය.
2. සාරි බැමිණිය.
3. මොග්ගල්ලන බැමිණිය.
4. රාධා බැමිණිය.
5. මන්තානි බැමිණිය.

(12) “ගිරග්ග සමජ්ජ” නාට්‍ය සංදර්ශනය නරඹා සසර කළකිරීමට පත් වූ උපතිස්ස කෝලිත දෙදෙනාට පළමුවෙන්ම මුණ ගැසුණු ආචාර්ය වරුන් වන්නේ,

1. ජෛන මහා වීර
2. පූර්ණ කස්සප
3. පකුධ කච්චායන
4. සංජය බෙල්ලට්ඨිපුත්ත
5. අජිත කේසකම්බලී

(13) සත්‍ය සොයා යන ගමනේදී උපතිස්ස පිරිවැජියාට දෙවනුව මුණ ගැසුනේ,

1. අස්සජි තෙරණුවෝ
2. කොණ්ඩඤ්ඤ තෙරණුවෝ
3. මහානාම තෙරණුවෝ
4. වප්ප තෙරණුවෝ
5. භද්දිය තෙරණුවෝ

(14) උපතිස්ස කෝලිත දෙදෙනා සෝවාන් වූයේ,

1. “ඉමස්මිං සති ඉදංහෝති” ගාථාව ඇසීමෙනි.
2. “සුඛකාමානි භූතානි ඉදංහෝති” ගාථාව ඇසීමෙනි.
3. “යේ ධම්මා හේතුප්පභවා” ගාථාව ඇසීමෙනි.
4. “නතං කම්මං කතං සාධු” ගාථාව ඇසීමෙනි.
5. “ඒක ධම්මං අතීතස්ස” ගාථාව ඇසීමෙනි.

(15) සැරියුත් තෙරණුවෝ පැවිද්දෙන් අඩමසක් යද්දී රජගහනුවර සූකරකත ලෙනෙහිදී බුදුරදුන් විසින් දේශනා කරන ලද සූත්‍රයක් ඇසීමෙන් රහත් විය. එනම්,

1. දීඝනඛ පරිබ්‍රාජකයාට - වේදනා පරිග්ගහ සූත්‍රය
2. දීඝනඛ පරිබ්‍රාජකයාට - දම්සක් පැවතුම් සූත්‍රය
3. දීඝනඛ පරිබ්‍රාජකයාට - ආදිත්ත පරියාය සූත්‍රය
4. දීඝනඛ පරිබ්‍රාජකයාට - කසීභාරද්වාජ සූත්‍රය
5. දීඝනඛ පරිබ්‍රාජකයාට - චූල්ලහත්ථි පදෝපම සූත්‍රය

(16) බුදුරජාණන් වහන්සේට තමන් තුළ පවතින ප්‍රසන්න භාවය විස්තර කරමින් බුදුරදුන් ඉදිරියට සැරියුත් තෙරුණ් විසින් දේශනා කරන ලද සූත්‍රය වන්නේ,

1. දීඝ නිකායේ සංගීති සූත්‍රය.
2. දීඝ නිකායේ දසුත්තර සූත්‍රය.
3. මජ්ඣිම නිකායේ සම්මාදිට්ඨි සූත්‍රය.
4. මජ්ඣිම නිකායේ ගුලිස්සානි සූත්‍රය.
5. දීඝ නිකායේ සම්පසාදනීය සූත්‍රය.

(17) සැරියුත් තෙරණුවන්ට ලැබුන අග තනතුරු නම්,

1. ඍද්ධිමතුන් අතර අග තනතුර හා ධර්ම භාණ්ඩාගාරික
2. මහා ප්‍රාඥයින් අතර අග්‍රස්ථානය හා ධර්ම සේනාධිපති තනතුර
3. ධූතවාදීන් අතරින් අග්‍රස්ථානය හා අග්‍ර උපස්ථායක තනතුර
4. ශික්ෂාකාමීන් අතර අග්‍රස්ථානය හා ඍද්ධිමතුන් අතර අග්‍රස්ථානය
5. ධූතවාදීන් අතරින් අග්‍රස්ථානය හා ධර්ම සේනාධිපති තනතුර

(18) සැරියුත් තෙරණුවෝ ප්‍රසංශා ලැබූයේ,

1. නිහතමානි ගුණය හා ඉවසීමේ ගුණය නිසාය.
2. කාරුණික හා ත්‍යාගශීලී නිසාය.
3. බුද්ධිමත් හා නැණවත් නිසාය.
4. බහුශ්‍රැත හා විනය ගරුක නිසාය.
5. ශ්‍රද්ධාවන්ත වීම හා මෛත්‍රී සහගත නිසාය.

(19) සැරියුත් තෙරණුවන්ගේ ගිහි කල බාල සහෝදරයා වූයේ,

1. ආරන්‍යවාසී භික්ෂූන් අතුරින් අග්‍ර වූ මජ්ඣිම හිමි.
2. ආරන්‍යවාසී භික්ෂූන් අතුරින් අග්‍ර වූ යස හිමි.
3. ආරන්‍යවාසී භික්ෂූන් අතුරින් අග්‍ර වූ රේවත හිමි.
4. ආරන්‍යවාසී භික්ෂූන් අතුරින් අග්‍ර වූ මහාකසුප් හිමි.
5. ආරන්‍යවාසී භික්ෂූන් අතුරින් අග්‍ර වූ අනුරුද්ධ හිමි.

(20) සැරියුත් හිමියන්ගේ සහෝදරියන් වන රහත් තෙරණින් වහන්සේලා නිවැරදිව දැක්වෙන්නේ,

1. චාලා, මාලා, උපචාලා
2. සුමනා, මාලා, සිසුපචාලා
3. චාලා, රධා, මාලා, සිසුපචාලා
4. චාලා, උපචාලා, සිසුපචාලා
5. චාලා, උපචාලා, සිසුපචාලා

***

සැකසුම:- පවිත්‍රා උඩුවරආරච්චි

ර/ගල්ලෑල්ල ම. වි.

ගල්ලෑල්ල

රත්නපුර